# අනුරාධපුර යුගයේ පොත්ගුල් මගින් හෙළිවන ලාංකේය අධ්‍යාපනයේ සුවිශේෂතා පිළිබඳ අධ්‍යයනයක්

මොනරාගල සුමන හිමි

**Abstract**

From ancient times to the present, every monastery in Sri Lanka has preserved a certain number of books, with a significant concentration of such collections being established during the Anuradhapura period. Among these, the three major monasteries; Mahavihara, Abhayagiri, and Jetavana, served not only as prominent religious centres but also as hubs of education, housing extensive collections of books. These books were stored in specially designated areas within the monastic complexes, known as "Pothguls" (book repositories).The objective of this research is to study the distinctive characteristics of Sri Lankan education as revealed through the *Pothguls* of the Anuradhapura period. The central research question seeks to explore what specific features of Sri Lankan education can be identified through the study of these *Pothguls*. The methodology primarily involves a literature-based study. The establishment of *Pothguls* was driven by the necessity to preserve and safeguard written records of Buddhist teachings, such as the Tripitaka and texts like the Helatuva, which had been orally transmitted until their transcription during the 1st century BCE. Essentially, a *Pothgul* functioned as the equivalent of a modern library. The *Pothgul* tradition at the Mahavihara is believed to have originated with the transcription of the Tripitaka and its associated commentaries, which were initially stored at the *Alulena* site in *Matale*. These foundational manuscripts were subsequently housed in locations associated with the Mahavihara, including the *Mirisavetiya*,

*Thuparamaya, Issarasamanarama, Vessagiriya*, and *Chetiyagiri* monasteries. The Mahavihara's Pothguls are considered the oldest repositories of books in Sri Lankan history. By the mid-Anuradhapura period, the *Abhayagiri* monastic tradition, established in the 1st century BCE, had developed an educational system that surpassed the *Mahavihara* tradition in scale and scope. The *Abhayagiri Pothguls* housed a diverse collection of manuscripts, encompassing texts on practical disciplines such as medicine, astrology, engineering, and the arts. Significant texts stored here included the *Uttara Viharattha Katha*, *Uttara Vihara Atthakatha*, and the *Uttara Vihara Mahavamsa*, which are considered part of the *Abhayagiri* tradition. Additionally, the Jetavana monastic center maintained its own collection of manuscripts in its Pothguls. By the 3$^{rd}$ century CE, with the decline of *Vaitulyavada* doctrines, the *Jetavana* and *Abhayagiri* monasteries preserved texts related to this sect alongside works associated with the *Theravada* tradition. Furthermore, *Jetavana* monks who adhered to neither *Theravada* nor *Vaitulyavada* compiled independent religious texts, which were also included in their *Pothguls*. This study examines the role and significance of *Pothguls* during the Anuradhapura period, offering insights into the educational, cultural, and intellectual developments of ancient Sri Lanka.

**Key words:** Anuradhapura Era, Pothgula, Abhayagiriya, Jethavana, Mahaviharay

**සාරසංක්ෂේපය**

ඈත අතීතයේ පටන් ම වර්තමානය දක්වා ම සෑම විහාරස්ථානයක ම පාහේ යම්කිසි පොත් ප්‍රමාණයක් තැන්පත් කර තිබෙන අතර අනුරාධපුර යුගය තුළ ද බොහෝ සෙයින් විහාරස්ථානවල පොත් තැන්පත් කර තිබේ. එහි දී ප්‍රධාන විහාරයන් තුනක් වශයෙන් මෙන්ම අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයන් තුනක් වශයෙන් හැඳිනගත

හැකි මහාවිහාරය, අභයගිරිය, ජේතවනයෙහි ද බොහෝ පොත් ප්‍රමාණයක් තැන්පත් කොට තිබුණි. එම පොත් තැන්පත් කිරීමට විහාරාරාමයන්හි විශේෂ ස්ථානයක් තනවා ඇති අතර එය "පොත්ගුල" නමින් හඳුන්වා ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ අනුරාධපුර යුගයේ පොත්ගුල් මගින් හෙළිවන ලාංකීය අධ්‍යාපනයේ සුවිශේෂතා අධ්‍යයනයයි. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ අනුරාධපුර යුගයේ පොත්ගුල් මගින් හෙළිවන ලාංකීය අධ්‍යාපනයේ සුවිශේෂතා මොනවාද? යන්න අධ්‍යයනය වේ. මෙම පර්යේෂණය සඳහා සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය අනුගමනය කර ඇත. පොත්ගුල් ආරම්භ කිරීමේ මූලික අවශ්‍යතාවය නිර්මාණය වන්නේ බුදුදහම හැඳින්වීමේ සිට මුඛ පරම්පරාවෙන් ගෙන එන ලද ත්‍රිපිටකය, හෙළටුවා වැනි කෘති ක්‍රි.පූ. පළවන සියවසේ දී ලේඛනගත කිරීමත් සමඟ ම ඒවා තැන්පත් කිරීමේ හා ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු වීමත් සමඟ වේ. සරළ ව ම කිවහොත් පොත්ගුලක් වර්තමාන පුස්තකාලයකට සමාන වේ. මහා විහාරයේ පොත්ගුල් සම්ප්‍රදාය පිළිබඳ සාකච්ඡා කළහොත් පොත්ගුල් සම්ප්‍රදාය ආරම්භ වන්නේ ත්‍රිපිටකය හා හෙළටුවා ලේඛනගත කළ මාතුල තුළ දනව්වේ පිහිටි අළුලෙනෙහි තැම්පත් කිරීමත් සමඟිනි. ආරම්භක ග්‍රන්ථ සම්භාරය එම ස්ථානයෙහි තැන්පත් කර ඇති බව සලකනු ලබන අතර එම ස්ථානය නිසැකව ම පොත්ගුලක් විය. මහා විහාරික භික්ෂූන් විසින් ත්‍රිපිටක හා අටුවා ලේඛනගත කරනු ලැබූ අතර එහි ආරම්භක ලේඛන ග්‍රන්ථයන් මහා විහාරයට අයත් මිරිසවැටිය, ථූපාරාමය, ඉස්සරසමණාරාමය, වෙස්සගිරිය සහ චේතිය විහාරය යන පංච මහා ආවාසයන්හි තැන්පත් කොට ඇත. මහා විහාරය සතු පොත්ගුල් ඓතිහාසික වශයෙන් පැරණිත ම පොත්ගුල් ලෙස පෙන්වා දිය හැකිය. ක්‍රි.පූ. පළමුවන සියවසේ දී ආරම්භ වූ අභයගිරි නිකායට සම්බන්ධ අධ්‍යාපන සම්ප්‍රදාය අනුරාධපුර යුගයේ මධ්‍ය භාගය වන විට මහා විහාර සම්ප්‍රදාය අභිබවා වර්ධනය වූ ආකාරය දක්නට ලැබුණි. මෙම විහාරය සතුව විවිධ විෂයන්ට අයත් ග්‍රන්ථ සම්භාරයකින් සමන්විත පොත්ගුල් පැවත ආ තිබේ. අභයගිරියේ වංශකතාව ලෙස සලකනු ලබන උත්තර විහාරට්ඨ කතා, උත්තර විහාරවාසීන්ගේ අටුවාව සහ උත්තර විහාර මහාවංශය ද මෙම විහාර පොත්ගුල්වල තැන්පත් කොට තිබේ. එමෙන්ම වෛද්‍ය, ජ්‍යොතිෂය, යන්ත්‍ර මන්ත්‍ර, කලාශිල්ප වැනි ප්‍රායෝගික විෂය මාලාවට අයත් ග්‍රන්ථයන් ද මෙහි

තැන්පත් කොට ඇත. එමෙන්ම ජේතවන අධ්‍යාපන මධ්‍යස්ථානයෙන් ද ග්‍රන්ථ සම්භාරයකින් සමන්විත පොත්ගුල් හමු වී තිබේ. ක්‍රි.ව තුන්වන සියවසෙහි වෛතුල්‍යවාදය නොපිළිගෙන අභයගිරිය හැර ගොස් සාගලිකවාදය ඇදහූ අවධියේ ඒ පිළිබඳ ව ලියැවුණු පොත් මෙන්ම, අභයගිරිය සමග සම්බන්ධකම් පැවැත් වූ අවධියේ පටන් වෛතුල්‍යවාදයට සම්බන්ධ පොත් ද එම පොත්ගුල්වල අන්තර්ගත විය. එසේම ජේතවන නිකායට අයත් පඬිවරුන් ථේරවාදයට හෝ වෛතුල්‍යවාදයට සම්බන්ධ නොවී සම්පාදනය කළා වූ ආගමික පොත්වලින් ද මෙහි පොත්ගුල් සමන්විත විය. මෙලෙස අනුරාධපුර යුගයේ පොත්ගුල් පිළිබඳ අධ්‍යයනයක් සිදු කොට ඇත.

**ප්‍රමුඛ පදඃ** අනුරාධපුර යුගය, පොත්ගුල්, අභයගිරිය, ජේතවනය, මහාවිහාරය

**හැඳින්වීම**

අනුරාධපුර යුගය විශේෂීකරණය කර දක්වමින් පොත්ගුල් සම්ප්‍රදාය පිළිබඳ ව හඳුනාගත හැකි අතර බෞද්ධ සාහිත්‍යය කැපී පෙනෙන වර්ධනයක් ලබන්නට ඇතැයි ද, අධ්‍යාපන මධ්‍යස්ථාන කැපී පෙනෙන ලෙස වර්ධනය වන්නට ඇතැයි ද පොත්ගුල් සහ පිරිවෙන් මගින් පැහැදිලි වේ. පොත්ගුල යනු කුමක්දැයි සුමංගල ශබ්දකෝෂයෙහි අර්ථ දක්වා ඇත්තේ, 'පොත්' යන්නට ග්‍රන්ථ සහ බඩු ආදී ගණන් ලියන පොත් භාරව සිටින්නා යන අර්ථය ද, 'ගුල්' ලෙස හඳුන්වා ඇත්තේ පොත් තබන ලද ගෘහයයි. මෙවැනි අර්ථ ගැන්වීම්වලින් පැහැදිලි වන්නේ ග්‍රන්ථකරණය කරන ලද ග්‍රන්ථ හෙවත් පොත් තැන්පත් කරන ලද ස්ථානය පොත්ගුල ලෙස අර්ථ ගැන්විය හැකි බවයි.

අනුරාධපුර යුගයෙහි වූ අභයගිරි, ජේතවන සහ මහාවිහාර යන ප්‍රධාන නිකායන් මූලික කර ගනිමින් අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව පුළුල් අධ්‍යයනය මගින් අවබෝධයක් ලබා ගැනීමේ හැකියාව පවතී. අධ්‍යාපනික කේන්ද්‍රස්ථාන තුනක් මෙන්ම විහාරස්ථාන තුනක් වශයෙන් ද ඇත අතීතයේ පටන් වර්තමානය දක්වා ම ප්‍රචලිත සහ වැදගත් වන මෙම ස්ථානවල පැවති පොත්ගුල්වල වූ ග්‍රන්ථ මගින් එකල අධ්‍යාපනය කෙබඳුදැයි යන්න මැනවින් වටහා ගත හැකිය.

ශ්‍රී ලංකාවේ ලේඛන කලාව ආරම්භයෙහි පටන් මුඛ පරම්පරාගතව ගෙන ආ නමුත් ඒවා ග්‍රන්ථාරූඪ කරමින් අනාගතයට උරුම කිරීමේ අපේක්ෂාවෙන් ආරම්භ කරන්නට ඇතැයි සඳහන් කළ හැකි මෙම පොත්ගුල් සහ සංවර්ධන අවධීන් ඔස්සේ ඉදිරියට පැමිණ ඇති අතර වර්තමානයෙහි ශේෂ ව පවතින ඓතිහාසික ලේඛනයන්හි මූලාරම්භය මෙය බව පැවසිය හැකිය.

මුඛ පරම්පරාගතව ගෙන ආ දැනුම අත්පිටපත් ලෙස ලිවීම, පිටපත් කිරීම, අධ්‍යයනයට පහසු ආකාරයෙන් එම දැනුම ගබඩා කිරීම, සංරක්ෂණය පිළිබඳ ව සැලකිය යුතු ආකාරයක අවධානයක් යොමු කරමින් නිර්මාණය වන්නට ඇතැයි සැලකිය හැකි ආයතනයකි පොත්ගුල්. වර්තමානයෙහි පුස්තකාලයක් හා සමාන පොත්ගුල් අනුරාධපුර යුගයෙහි ප්‍රධාන විහාරස්ථාන ත්‍රිත්වය කේන්ද්‍ර කර ගනිමින් පැවැති බවට පුනරාවර්තනය කළ හැකිය. ආගමික අධ්‍යාපනික අරමුණු කේන්ද්‍ර කර ගනිමින් ආරාම සංකීර්ණවල කොටසක් ලෙස වර්ධනය වන්නට ඇතැයි සැලකිය හැකි පොත්ගුල්හි අටුවා ග්‍රන්ථ, වංශකථා, වෛද්‍ය, ජෝතිෂය, යන්ත්‍ර මන්ත්‍ර, කලා ශිල්ප වැනි විෂයන් මෙන්ම ඉතිහාසය, විවරණ ආදී විවිධ විෂය ක්ෂේත්‍රයන් ආවරණය කරමින් ග්‍රන්ථ ගබඩාකරණය කරන්නට ඇත. විවිධ ශාස්තෘවරුන්, විද්වතුන් සහ භික්ෂූන් වහන්සේලා විසින් සිය මෙහෙවරක් ලෙස සිතමින් මෙම දැනුම සංරක්ෂණය අධ්‍යයනයට සහ අනාගත පරපුරට දායාද කිරීමට අවශ්‍ය පියවරක් වශයෙන් පොත්ගුල් නිර්මාණය වන්නට ඇත.

ආරාම අධ්‍යාපනය, පොත්ගුල් සාහිත්‍යය, විවිධ පඬිවරුන් අනුරාධපුරා අවධියෙහි ලාංකීය අධ්‍යාපනයෙහි අංග වශයෙන් දැක්විය හැකිය. ග්‍රන්ථ එකතුවක් සහිත දැනුම් ගබඩාවක් වූ පොත්ගුල් මගින් ඒවා හොඳින් නඩත්තු කරමින් පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස වර්තමානයට ද එම දැනුම සහ අධ්‍යාපනය දායාද වන්නට ඇත. මෙසේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ ව සඳහන් කිරීමේ දී පොත්ගුල් සුවිශේෂී භූමිකාවක් වශයෙන් දැක්විය හැකිය.

අනුරාධපුර සමයෙහි පොත්ගුල් මගින් හෙළිවන අධ්‍යාපනික ක්‍රමයේ සුවිශේෂතා පිළිබඳ ව තවදුරටත් විමර්ශනය කරන්නේ නම් සමකාලීන විද්වතුන්ගේ අදහස් ද වැදගත් වන අතර "සෙනරත්

පරණවිතාන" මහතාගේ අදහස වී ඇත්තේ "ශිලා ලේඛන හා පුරාණ ග්‍රන්ථ පිළිබඳ ව අධ්‍යයනයෙන් අනුරාධපුර යුගයේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ ව තීරණාත්මක තොරතුරු සපයාගත හැකි බවයි."

ඒ අනුව පර්යේෂණ මාතෘකාවට අදාළව මෙම සුවිශේෂතා සවිස්තරාත්මකව අධ්‍යයනය කිරීමේ හැකියාව ඇති බව ඉදිරියේ දී අනාවරණය වනු ඇත.

**සාකච්ඡාව**

බුදුදහම හඳුන්වාදීම ත් සමග මෙරට ආරම්භ වූ බෞද්ධ අධ්‍යාපනය පදනම් කර ත්‍රිපිටකය සහ හෙළටුවා මුඛ පරම්පරාවෙන් ගෙන ඒම හේතු පාදක කර ගනිමින් ක්‍රි.පූ. පළමුවන සියවසේ දී ඒවා ග්‍රන්ථාරූඪ කිරීම ආරම්භ විය. එලෙස ලේඛනගත වූ ග්‍රන්ථ සම්භාරය තැන්පත් කිරීමත් සමඟ ම මෙරට පොත්ගුල් සම්ප්‍රදායේ මූලාරම්භය සනිටුහන් විය. අනුරාධපුර යුගය තුළ මෙම පොත්ගුල් සම්ප්‍රදාය ප්‍රධාන විහාර ත්‍රිත්වයක් මෙන්ම අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් ලෙස හඳුන්වනු ලබන මහා විහාරය, අභයගිරිය, ජේතවනයට අයත් අනුබද්ධ ආයතන තුළ පොත්ගුල් සම්ප්‍රදාය ප්‍රචලිත වූ අතර එම පොත්ගුල් තුළ ත්‍රිපිටකය මෙන්ම අටුවා ඇතුළු විවිධ ග්‍රන්ථ වර්ග තැන්පත් කරන ලදී.

පොත්ගුල් සම්ප්‍රදාය බිහිවීමෙහිලා හේතු සාධක කිහිපයක් බලපා ඇත. ඒ අතර ක්‍රි.පූ හයවන සියවසේ ඉන්දියාවේ උතුරු දෙසින් ආර්යයන් මෙරටට පැමිණීම, මෙරට විවිධ පෙදෙස්හි ගංගා නිම්නයන්හි ජනාවාස පිහිටුවා ගැනීම, ක්‍රි.පූ හතරවන සියවසේ පණ්ඩුකාභය රජු අනුරාධපුර මූලස්ථානය කර ගනිමින් ප්‍රථම රාජධානිය පිහිටුවා ගැනීම යන සාධක දක්නට ලැබේ.

මහාවිහාර, අභයගිරි හා ජේතවන නිකායන්ට සම්බන්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයන්හි ඒ ඒ නිකායට විශේෂිත වූ ආගමික, අධ්‍යාපනික සම්ප්‍රදායන් පදනම් කර ගනිමින් පොත්ගුල් හා පොත්ගුල්වල තැන්පත් කරන ලද ග්‍රන්ථ නිර්මාණය විය. මහාවිහාර පොත්ගුල් සම්ප්‍රදායේ ආරම්භක ස්ථානය වශයෙන් මාතුල දනව්වේ පිහිටි අලුලෙන පෙන්වාදිය හැකිය. ත්‍රිපිටක හා හෙළටුවා ලේඛනගත කොට මෙහි තැන්පත් කොට ඇත. ත්‍රිපිටකය සහ අටුවා ලේඛනගත

කරන ලද්දේ මහා විහාරික භික්ෂූන් බැවින් ආරම්භයේ ලේඛනගත කරනු ලැබුවා වූ ග්‍රන්ථ සම්භාරය මිරිසවැටිය, ථූපාරාමය, ඉස්සරසමණාරාමය, වෙස්සගිරිය, චේතිය විහාරය යන පංච මහා අවාසයන්හි තැන්පත් කොට තිබේ. මෙම පොත්ගුල් ඓතිහාසික වශයෙන් පැරණිතම හා වටිනාකමකින් සමන්විත පුද්ගල ලෙස හැඳිනගත හැකිය (පැරණි ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය, 2006; 105).

මහා විහාරය පදනම් කරගෙන නිර්මාණය වූ අනෙකුත් ස්ථානයන්හි ක්‍රමවත් සැලැස්මක් පරිදි ත්‍රිපිටක හා අටුවා පිටපත් කිරීම මෙන්ම බෙදාහැරීම සිදු කර ඇත. සබරගමුවට හා රෝහණයට අවශ්‍ය පිටපත් සබරගමු ගල් විහාරයක කරවූ බවට කිරිඇල්ලේ ඥාණවිමල හිමියන්ගේ අදහස විය. මෙම විහාරයේ එනයින් පොත්ගුල් වෙහෙර නමින් හඳුන්වා ඇත. (පැරණි ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය, 2006; 106)

මහා විහාරයට අයත් පොත්ගුල් තුළ ඉතිහාසය සහ බුදු දහමට සම්බන්ධ පුරාවස්තු අළලා ලියණු ලැබූ වංශකතා, රාජ්‍ය පරිපාලනය, නීතිය, ව්‍යාකරණ, සාහිත්‍ය, වෛද්‍ය ශාස්ත්‍රය, නක්ෂත්‍ර විෂයයන් සම්බන්ධ ලියැවුණු පොතපත ද මෙහි තැන්පත් කොට තිබේ. මහාවිහාරයට අයත් ප්‍රධාන පොත්ගුල දූරසංකර ග්‍රන්ථාකර පිරිවෙන විය. මෙහි පාලි අටුවාවන් මෙන්ම හෙළ අටුවා ථෙරවාදයට අයත් නොවූ ග්‍රන්ථ ද අන්තර්ගත විය. මහා විහාරවාසීන් හෙළටුවා පාලියට නැගීමට ඉඩ ලබා දී ඇති අතර පාලි භාෂා සාහිත්‍යයේ නැගීමට මනා සේවයක් ලබා දී ඇත. එමෙන්ම මහා විහාරයට අයත් ගලතුරු මූලයෙහි හා විල්ගමූලයෙහි අගනා පොත්ගුල් පැවත තිබේ.

ක්‍රි.පූ පළමුවන සියවසෙහි ආරම්භ වූ අභයගිරි නිකායට සම්බන්ධ අධ්‍යාපන සම්ප්‍රදාය අනුරාධපුර යුගයෙහි මැදභාගය වන විට අභයගිරි සම්ප්‍රදාය මහා විහාර සම්ප්‍රදාය අභිබවා වර්ධනය වී ඇත (පැරණි ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය, 2006; 109). මෙම අධ්‍යාපනික මධ්‍යස්ථානය කේන්ද්‍රකොට ගනිමින් පොත්ගුල් කීපයක් මෙන්ම විශාල ග්‍රන්ථ සම්භාරයක් දක්නට ලැබුණි. අභයගිරි වංශකථාව වන උත්තරවිහාරට්ඨකතා, උත්තර විහාරවාසීන්ගේ අටුවාව සහ උත්තර විහාර මහාවංශය මෙම පොත්ගුල්වල තැන්පත් කොට ඇත. වෛද්‍ය,

ජ්‍යොතිෂ, යන්ත්‍ර මන්ත්‍ර, කලා ශිල්ප ආදී විවිධ ග්‍රන්ථ මෙහි දක්නට ලැබුණි. මෙම ග්‍රන්ථ සංස්කෘත බසින් ද ලියා තිබුණි.

එමෙන්ම මහායාන බුදුදහම තාන්ත්‍රික ධර්මය සමග මිශ්‍රවීමේ ප්‍රතිඵලයක් වශයෙන් වජ්‍රයාන සහ මන්ත්‍රයාන ක්‍රි.ව. අටවන සියවස වනවිට මෙරට පැතිර ගොස් ඇති අතර එම ධර්මයට අදාළ පොත් රාශියක් අභයගිරි පොත්ගුල්වල තිබූ බවට සාධක පවතී (නිකාය සංග්‍රහය, (9,18). එමෙන්ම අභයගිරි අධ්‍යාපනයට මහායාන මෙන්ම ථේරවාදය ද ඇතුළත් වූ හෙයින් ඒ ඒ නිකායන්ට අයත් වූ ත්‍රිපිටක ග්‍රන්ථ සම්භාරයක් මෙහි තැන්පත් කොට තිබෙන්නට ඇත (හියුංසියං, (321). ඒ ඒ නිකායන්ට අදාළ හෙළ අටුවා, ටීකා සහිත ත්‍රිපිටක දහම අඩංගු ග්‍රන්ථ ද මෙහි තැන්පතු තුළ දක්නට ලැබුණි.(පැරණි ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය, 2006; 110). වෛතුල්‍යවාදය, වාජිරියවාදය, රත්නකූටයට අයත් ග්‍රන්ථ ද මෙහි අන්තර්ගත විය.

මහායාන බුදුදහමෙහි උන්නතිය උදෙසා කටයුතු කරනු ලැබූ ආචාර්ය නාගාර්ජුන, ආර්යදේව, පාර්ශව, වසුමිත්‍ර, මාතෘචෙට, අසංග, වසුබන්ධු, මනෝරත, කුමාරලබ්ධ, ධර්මපාල, ශීලභද්‍ර, ප්‍රභාකරචිත්‍ර, චන්ද්‍රගෝමි, දින්නාග, ස්ථිරමති, ශාන්තිදේව, ආර්ය ශුපොද, ධර්මකීර්ති, ශාන්තරක්ෂිත, පද්මසම්භව, කමලශීල දෙවෙන්ද්‍රබෝධි සහ මහා කවි භදන්ත, අශ්වඝෝෂ ආදීහු විසින් රචිත මාධ්‍යමික, යෝගාචාර, සෞත්‍රාන්ත්‍රික, වෛභාෂික යන දර්ශනයන් ද ඊට අදාළ සර්වශුන්‍යවාදය, විඥ්ඥාණවාදය, බහ්‍යාර්ථ අනුමෙයදත්වාදය, බහ්‍යාර්ථ ප්‍රත්‍යක්ෂවාදය ආදි ග්‍රන්ථයන් ද අභයගිරි පොත්ගුල්වල තැන්පතු විය (ලක්දිව මහායාන අදහස්, (258-317). අභයගිරි ප්‍රධාන අධ්‍යාපන ආයතන වන කපාරමූල, වහදුමූල, උතුරුමූල සහ මහනෙත්පාමූල යන මූලායතනයන්හි ද පොත්ගුල් තිබී ඇත.

ජේතවන විහාරය පදනම් කොට ගනිමින් ද අධ්‍යාපන මධ්‍යස්ථානයන්හි පොත්ගුල් පැවැති බවට සාධක හමු වී ඇත. එමෙන්ම එම පොත්ගුල්වල විශාල ග්‍රන්ථ සම්භාරයක් තැන්පත් කර තිබේ. ක්‍රි.ව 3 වන සියවසේ වෛතුල්‍යවාදය නොපිළිගෙන අභයගිරිය හැරගොස් සාගලිකවාදය ඇදහූ අවධියේ ඒ පිළිබඳ ලියවුණු පොතපත, ක්‍රි.ව. 6 වන සියවසේ සිලාකාල රජ සමයේ වෛතුල්‍යවාදය පිළිගෙන,

අභයගිරිය සමඟ සම්බන්ධකම් පැවැත්වූ අවධියේ පටන් වෛතුල්‍යවාදයට සම්බන්ධ පොත්පත් එම පොත්ගුල්වල තැන්පත් වී ඇති බැව් සැලකිය හැකිය (පැරණි ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය, 2006; 114). එමෙන්ම ජේතවන නිකායට අයත් පඬිවරුන් විසින් ථේරවාදයට හෝ වෛතුල්‍යවාදයට සම්බන්ධ නොවී සම්පාදනය කරන ලද ග්‍රන්ථ ද මෙහි විය. සාගලිකතිස්ස හිමියන් විසින් රචිත ව්‍යාඛ්‍යාන සමූහය නම් ආගම පිළිබඳ රචනා කළ ග්‍රන්ථ සමූහයද, (නිකාය සංග්‍රහය, 12,13). වියත් භික්ෂූන් වහන්සේලා විසින් රචිත ධර්මය ඇතුළු විවිධ විෂයන්ට අදාළව සහ වෙනත් වාදයන් අන්තර්ගත කර ලියණු ලැබූ පොත පත ද මෙහි අන්තර්ගත විය (වංසත්තප්පකාසනී, 1994; 123).

ජේතවන පොත්ගුල් සම්ප්‍රදාය පිළිබඳ ලියැවී ඇති සාහිත්‍ය ලේඛනගත තොරතුරු අල්ප වුව ද ශිලා ලේඛන මගින් වඩාත් වටිනා තොරතුරු හමුවේ. ජේතවනාරාම භූමියෙන් හමු වූ සෙල්ලිපිකඩ සහ අභයගිරි සංස්කෘතික ශිලාලිපිය ඊට නිදර්ශන සපයනු ලබයි. (එපිග්‍රැපියා සෙලනිකා. වෙළුම 01.1912; 9) එමෙන්ම ජේතවනයට අයත් වූ දකුණු මූල සහ සෙනෙවිරත් මූලයෙහි ප්‍රධාන පොත්ගුල් තිබෙන්නට ඇති බව නිසැක ය.

මහාවිහාර, අභයගිරිය, ජේතවන පොත්ගුල් සම්ප්‍රදාය මගින් ගොඩනැගුණු අධ්‍යාපනය පිළිබඳ ව සාකච්ඡාවට ලක් කිරීමේ දී සෑම පිරිවෙනකට ම නැතහොත් අධ්‍යාපන මධ්‍යස්ථානයකට ම පාහේ තිබූ පොත්ගුල් තුළ ප්‍රථමවරට ග්‍රන්ථාරූඪ කළා වූ ථේරවාදීන්ගේ ත්‍රිපිටකය හා අටුවා ග්‍රන්ථ තිබෙන්නට ඇති බැව් නිසැක ය. අභයගිරි හා ජේතවන නිකායන්ගේ පොත්ගුල්වල ථේරවාදීන්ගේ ත්‍රිපිටකය සහ අටුවා මෙන්ම මහානිකායන්ගේ ත්‍රිපිටක ද තැන්පතු විය. මෙකල භික්ෂු අධ්‍යාපනය ත්‍රිපිටකය හා අටුවා පදනම් කරගනිමින් ලබා දෙනු ලැබීය.

එමෙන්ම මෙම පොත්ගුල් තුළ ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයන්ට අනිවාර්යෙන් ම හැදෑරිය යුතු වූ සතර බණවර, ඇනවුම් සකස්කඩ හා දම්පියා ග්‍රන්ථ මෙන්ම සාමණේර භික්ෂූන් වහන්සේලා පරිශීලනය කළ යුතු හෙරණ සිඛ සහ හෙරණසිඛ විනිස, සේකියා හා දසදම්ම සූත්‍රය යන ග්‍රන්ථ ද, උපසම්පදාවට ලත් භික්ෂූන් විසින් හැදෑරිය යුතු

වූ සිඛවළඳ, සිඛවළඳ විනිස, කුදු සිඛ සහ කතිකාවණ ද තැන්පතු විය.

ආරම්භක සමයේ දී අධ්‍යාපනය ත්‍රිපිටකය හා අටුවාවන්ට සීමා වුව ද කල්යත් ම වෙනත් විෂයයන්ගේ මෙන්ම ප්‍රායෝගික විෂයයන්ගෙන් සමන්විත ග්‍රන්ථ ද එහි දක්නට ලැබුණි. එමෙන්ම මහායාන බුදු දහමේ සංකල්පයක් වූයේ සෑම මහායානියක ම බෝධිසත්ත්වයෙකු බවයි. එනයින් බෝධිසත්ත්වයකු විසින් අධ්‍යයනය කළ යුතු අනිවාර්ය විෂයන් පහක් වූ අතර ඒවා පංචවිද්‍යා වශයෙන් හඳුන්වනු ලැබීය. එම පංචවිද්‍යා ලෙස ආධ්‍යාත්මික විද්‍යාව, හේතු විද්‍යාව, ශබ්ද විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ශිල්ප කර්මාන්තය පෙන්වා දිය හැකිය (ලංකාවේ අධ්‍යාපනය, 1969; 54). මෙම ග්‍රන්ථයන් කේන්ද්‍රීය අධ්‍යාපන මධ්‍යස්ථාන ත්‍රිත්වයේ ම දක්නට ලැබුණි.

පොත්ගුල් පරිහරණය කිරීමේ දී විශේෂ නීති පද්ධතියක් ක්‍රියාත්මක වී ඇත. පොත්ගුල් පරිහරණයට ඉඩ දී ඇත්තේ පරිහරණය කරන්නන්ගේ බුද්ධි මට්ටම සලකා බැලීමෙන් අනතුරුව වේ. ග්‍රන්ථ රචනය දුෂ්කර කාර්යයක් වූ හෙයින් අසන්නන්හට මෙන්ම අනාගත පරපුර සඳහා පොතපත ආරක්ෂා කර ගැනීමට මෙලෙස සිදු කොට ඇති බැවින් නිසැක ය.

පොත්ගුල් සම්ප්‍රදායේ විශේෂත්වයක් වන්නේ ග්‍රන්ථ පිටපත් කිරීම මෙන්ම බෙදාහැරීම නිසි ක්‍රමවේදයකට අනුව සිදු කිරීමයි. ඒ බැව් මින් පෙර ද පෙන්වා දී ඇති අතර ජාත්‍යන්තර වශයෙන් ද පොත් බෙදා හැරීමේ සේවාවක් ද පවත්වා ඇත. ථෙරවාදී බුදුදහම අන්තර්ගත පොත් දකුණු ඉන්දියාව, බුරුමය, සියම ආදී රටවල්වලට බෙදාහැර ඇත. මහා විහාර, අභයගිරි හා ජේතවන නිකායන් අතර මත භේදයන් පැවතුණ ද තමන්ට අයත් පොත්ගුල් වෙනත් නිකායන්ට පරිහරණය කිරීම ඉඩ ලබා දී තිබීම විශේෂ වේ.

## නිගමනය

බුදුදහම හඳුන්වාදීමත් සමග බෞද්ධ අධ්‍යාපනය පදනම් කරගනිමින් ත්‍රිපිටක හෙළ අටුවා මුඛ පරම්පරාවෙන් රැගෙන ඒමත් සමග ඒවා ග්‍රන්ථාරූඪ කිරීම සිදුකළ අතර එමඟින් පොත්ගුල් සම්ප්‍රදායට මූලික අඩිතාලම වැටුණි. අනුරාධපුර යුගය තුළ පුද්ගල සම්ප්‍රදාය මහා

විහාරයේ අභයගිරියේ ජේතවනය යන විහාරයන්හි මෙන්ම අනුබද්ධ ආයතන තුළ බහුලව දක්නට ලැබුණු අතර අනුරාධපුර යුගයෙහි මෙසේ ඉතා දියුණු මට්ටමේ පොත්ගුල් සම්ප්‍රදායක් හැදින ගත හැකි විය. ප්‍රථම වරට මෙරට තුළ ග්‍රන්ථාරූඪ කරන ලද ථේරවාදී ත්‍රිපිටක හා අටුවා ඇතුළු විවිධ විෂයන්ට අයත් ග්‍රන්ථ රාශියක් මෙම පොත්ගුල්වල තබා ආරක්ෂා කර අනාගතය වෙනුවෙන් දායාද කිරීමට සමත්කම් දක්වා තිබීම සුවිශේෂී වැදගත්කමක් වේ. එමෙන්ම අනුරාධපුර යුගයේදී ග්‍රන්ථ පිටපත් කිරීම මෙන්ම දේශීය මෙන්ම විදේශීය වශයෙන් ග්‍රන්ථ බෙදා හැරීමේ සේවාවක් පැවැත්වීම ආදියෙන් ජගත් කීර්තියට පත් පොත්ගුල් සම්ප්‍රදායෙහි කේන්ද්‍රීය අධ්‍යාපන මධ්‍යස්ථානයන් ඔස්සේ ක්‍රියාත්මක වූ බවට නිගමනය කළ හැකිය. බුදුදහම ලංකාව තුළ ව්‍යාප්ත වීම ත් සමග කලාශිල්ප මෙන්ම අධ්‍යාපනික වර්ධනයත් සිදුවිය. මෙසේ ක්‍රම ක්‍රමයෙන් සංවිධානාත්මක අධ්‍යාපන රටාවක් බිහි වූ ලාංකීය අතීතය අනුරාධපුර යුගය කේන්ද්‍ර කර ගනිමින් සුවිශේෂීත්වයෙන් යුතුව ඉහත පරිදි සාකච්ඡා කළ හැකි අතර මෙසේ අධ්‍යාපනය දියුණුවීම ලාංකීය ඉතිහාසයේ ජගත් කීර්තියට පත්වීම ත් අධ්‍යයන කටයුතු තවදුරට ත් පුළුල් වෙමින් අතීතයේ අධ්‍යයනයටත් එම අතීත සුවිශේෂීතා නිදර්ශන ලෙස ගනිමින් වර්තමානයට ඒවා ආදේශ කිරීමේ හැකියාවක් පවතින බව ද සඳහන් කිරීම වැදගත් වනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

එපිග්‍රැපියා සෙලනිකා. වෙළුම.1 (1912)

වික්‍රමනායක, අබේසිංහ, (1999), පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය,

විමලබුද්ධි හිමි. බලගල්ලේ., (1960). බෞද්ධ රාජධානි පිළිබඳ තොරතුරු නම් වූ පාහියන්ගේ දේශාටන වාර්තාව.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ. (1959). දීපවංසය.

වික්‍රමසිංහ ඩී.එම්.ඩී.ඉසෙඩ්, (1933). එපිග්‍රැපියා සෙලනිකා වෙළුම .03

විමලකීර්ති හිමි, මැද උයන්ගොඩ. (1954), ශාසනවංස ප්‍රදීපය,

රණසිංහ. ආර්. එච්. අයි. එස්. (2006.) පැරණි ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය. කැළණිය ආර්. එච්. අයි. එස් රණසිංහ, (27) ලුම්බිණි මාවත, දළුගම, කැළණිය.

රාහුල හිමි, වල්පොල, (1999), ලක්දිව බුදු සමයේ ඉතිහාසය.